# මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ 2022.12.12 දින පැවති මහා සභාවේ වාර්තාවයි.

2022.12.12 වන දින පෙ.ව 09.30 ට පමණ ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිණියගේ ප්‍රධානත්වයෙන් සභා කටයුතු ආරම්භ කරන ලදී.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
අද දින සභා රැස්වීම සඳහා පැමිණ සිටින ඔබ සියළුම දෙනා ඉතාමත් ආදරයෙන් පිළිගන්නා අතර ආගම සිහි කිරීමෙන් අනතුරුව සභා කටයුතු ආරම්භ කර සිටිමු.

## 01. පසුගිය සභා වාරයේ වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම සහ වාර්තාව සභා සම්මත කිරීම.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
මීළඟට පසුගිය සභා වාරයේ වාර්තාව සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
පසුගිය සභා වාරයේදී මස්කෙළිය නගරයේ පිහිටි ලොරි රථ ගාල සම්බන්ධයෙන් සාකච්ඡා කර ඒ සඳහා තීරණයක් ද ලබාගෙන තිබුණා. නමුත් එය වාර්තාවේ සඳහන් වී නැත.

**සංශෝධන**

එම වාහන රථගාලේ වංගුව සහිත කොටස හැර ඉතිරි කොටසේ වාහන ගාල් කිරීමටද, අනෙකුත් වාහන ගාල් කිරීම සඳහා වෙනත් ස්ථානයක් වෙන්කර ලබාදීම සඳහාද සභාවේ තීරණයක් ලබා ගන්නා ලදී.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
පසුගිය සභා වාරයට පෙර සභා වාරයේ දී ඉදිරිපත් කරන ලද සමාජ සුභසාධන කූපන් පත් පිළිබඳ කාරණාව සම්බන්ධයෙන් මෙතෙක් ලිපි යොමු කර නැහැ. ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙසට ඉල්ලා සිටිමි. එය මේ වන විට ඉතාමත් ප්‍රමාද වී තිබෙනවා.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
එම කාරණාව සම්බන්ධයෙන් යෝජනා කොටසේ සඳහන් වී නැහැ. එය සාකච්ඡා වී තිබෙන්නේ වෙනත් කරුණු සම්බන්ධ කොටසෙයි. එසේ ලිපි යොමු කර නැතිනම් ඒ සඳහා ලිපිය යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමු.

**ගරු මන්ත්‍රී ටී.වසන්තකුමාර් මැතිතුමා (ලං.ක.කො)**
සංශෝධන සමග පසුගිය සභා වාරයේ සභා වාර්තාව නිවැරදි බවට මම යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
එම යෝජනාව මා ස්ථිර කරමි.

**තීරණ අංක 01**
2022.11.14 දිනැති සභා වාර්තාව නිවැරදි හා සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

## 02. ගරු සභාපතිතුමිය විසින් කරනු ලබන විශේෂ නිවේදන.

මස්කෙළිය නගරයේ සහ ඒ ආසන්න ප්‍රදේශවල ඉඩම් ඔප්පු පිළිබඳව ප්‍රශ්නය පසුගිය කාල වකවානුව තුළ සාකච්ඡා කළ අතර ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් නිලධාරීන් ද පසුගිය 26 වන දින මස්කෙළිය නගරයේ පිහිටි අම්බාල්ස් ශාලාවට පැමිණ මේ පිළිබඳව සාකච්ඡා කරන ලදී. මෙම සාකච්ඡාව සඳහා නගරයේ වෙළෙඳ ප්‍රජාව සහ අනෙකුත් ජනතාව සහභාගී වී සිටියා. එදින මෙම සාකච්ඡාව සඳහා සහභාගි වූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ජීවන් තොන්ඩමන් මැතිතුමා මෙම ඔප්පු පිළිබඳව ලේඛන සම්පාදනය කරන ලෙස පවසා සිටියා. ඉදිරියේදී මේ පිළිබඳව තොරතුරු ලබාගෙන ඉඩම් ඔප්පු ලබා දීමට කටයුතු සිදු කරමු.

එමෙන්ම 2023 වර්ෂය සඳහා වූ මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ අයවැය වාර්තාව ජනතාවගේ යෝජනා ද ලබා ගනිමින් ඉතාමත් සාර්ථක ලෙස සකස් කර තිබූ බැවින්, එම අය වැය වාර්තාව අගය කරමින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය මගින් පැවැත්වීමට නියමිත විශේෂ සම්මේලනයකට සහභාගි වීම සඳහා අප සභාවටද ආරාධනා කර තිබෙනවා. මෙය අප සභාවට ලැබී ඇති විශේෂ ගෞරවයක්.

<u>**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**</u>
මෑතකදී මම ගරු මන්ත්‍රී රාජ්කුමාර් මැතිතුමා සමඟ නුවරඑළියට ගිය අවස්ථාවේදී ඉඩම් කච්චේරිය සම්බන්ධව පැවති රැස්වීමක් සඳහා සහභාගී වුණා. සමස්ත අඹගමුව ප්‍රදේශයටම ඉල්ලුම්පත්‍ර 58 ක් පමණක් ලැබී තිබෙන බවට එහිදී පැවසුවා. එම 58 දෙනාට බලපත්‍ර ලබාදී ඇති බවටත් ලේඛනයේ නම සඳහන් වෙනවා නම් පමණක් එම කාර්යය සිදුවන බවටත් එහිදී පැවසුවා. සමහර කටයුතු සිදුවෙමින් පවතිනවා. ගරු සභාපතිතුමිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාව සමග සාකච්ඡා කර මේ සඳහා යම් ක්‍රියාමාර්ගයක් ලබා ගන්නවානම් වඩාත් සුදුසුයි.

<u>**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**</u>
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් පසුගිය 26 වැනි දින පැමිණි පසුව සභාව මගින් දැනුම්දීමක් සිදු කිරීමෙන් අනතුරුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ලේඛන ලබාගෙන මේ වන විට අදාල කටයුතු සිදුවෙමින් පවතිනවා.

<u>**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**</u>
නගරය හා වතු ප්‍රදේශය අතර මැද සිටින ජනතාවට එවිට කුමක්ද සිදු වන්නේ?

<u>**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**</u>
මෙම කටයුත්ත සි දු කිරීම සම්බන්ධයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී තුමාට ස්තූතිය පුද කරන අතර මේ පිළිබඳව සොයා බැලීමේදී මෙම කාර්යය ඉටුකිරීම සභාව මඟින් සිදුකළ එකක් කියන එක අමතක කරන්න බැහැ. පසුගිය මාස හයකට පෙර සභාවේ දී නෝටන් මාර්ගය පිළිබඳව ඉදිරිපත් කරන ලද යෝජනාවකට අනුවද තුන්වන මාසයේදී යොමු කරන ලද ලිපියකට අනුව ද ඒ සඳහා ක්‍රියාත්මක වෙමින් 06 වන මාසයේ දී පමණ ගිනිගත්හේන දී ඉඩම් කච්චේරියක් පැවැත්වූවා. ඒ අවස්ථාවට 175 දෙනෙකු ඉල්ලුම් කර තිබුණා. මෙම ඉඩම් කච්චේරිය සිදු කිරීම මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ මැදිහත් වීමෙන් ඉටු කර තිබෙනවා. මේ සඳහා සියලුම දෙනාට ස්තුතිය පුදකරමි.

## 03. සභාව වෙත ලැබී ඇති ලිපි සහ පැමිණිලි සභාවට ඉදිරිපත් කිරීම.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
මීළඟට සභාවට ලැබී ඇති ලිපි සහ පැමිණිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමි.

**ලිපි අංක 01**
යොමු කරන්නා - ගරු මන්ත්‍රී කේ. එල්. ඒ. රංජනී මැතිණිය.
විෂය - 2022.12.12 දිනැති සභා රැස්වීම සඳහා සහභාගිවීමට නොහැකි බව දන්වන ලද නිවාඩු ලිපිය

**<u>ගරු මන්ත්‍රිනී කේ.ජී.කුසුමාවතී පෙරේරා මැතිතුමිය (ලං.ක.කො)</u>**
ගරු මන්ත්‍රී කේ. එල්. ඒ. රංජනී මැතිතුමියගෙ නිවාඩු යෝජනාව මා ඉදිරිපත් කරමි.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
එම යෝජනාව මා ස්ථිර කරමි.

**තීරණ අංක 02**
ගරු මන්ත්‍රී කේ. එල්. ඒ. රංජනී මැතිණියගේ නිවාඩුව සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**ලිපි අංක 02**
යොමු කරන්නා - ආදායම් පරීක්ෂක, මස්කෙළිය ප්‍රාදේශීය සභාව.
විෂය - 2023 වර්ෂය සඳහා මස්කෙළිය ප්‍රාදේශීය සභාව මඟින් වරිපනම් සහ බදු මුදල් අයකිරීම පිළිබඳව ගැසට් නිවේදනය පල කරීම සම්බන්ධ ලිපිය

**තීරණ අංක 03**
2023 වර්ෂය සඳහා මස්කෙළිය ප්‍රාදේශීය සභාව මඟින් වරිපනම් සහ බදු මුදල් අයකිරීම පිළිබඳව ගැසට් නිවේදනය පල කරීම සඳහා සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදී.

මස්කෙළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බදු අයකරන ප්‍රදේශවලින් අයකර ගනු ලබන බදු ප්‍රතිශතය වැඩි කිරීම සම්බන්ධයෙන් සභාවේ ගරු මන්ත්‍රීවරුන් විසින් සාකච්ඡාවට ලක් කරන ලදී.

**තීරණ අංක 04**
ඉහත සඳහන් කරන ලද වරිපනම් ප්‍රතිශතය වැඩි කිරීම සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ලිපියක් යොමු කිරිමට තීරණය කරන ලදී.

**ලිපි අංක 03**
යොමු කරන්නා - විෂය භාරකරු, මස්කෙළිය ප්‍රාදේශීය සභාව.
විෂය - මස්කෙළිය ප්‍රාදේශීය සභාව සඳහා මිලදී ගනු ලබන ගලි යන්ත්‍රයේ මුළු මිලදී ගැනීමේ වටිනාකමෙන්, ණය මුදලට වඩා ගෙවීමට නියමිත මුදල සභාව මගින් ගෙවීම සම්බන්ධයෙන්, සභාවේ අනුමැතිය ඉල්ලා ඇති ලිපිය.

**තීරණ අංක 05**
දේශීය ණය සහ සංවර්ධන අරමුදල යටතේ රු. 1600000.00 ක ණය මුදලට අමතරව ගලි ටැංකිය සඳහා වැය කල යුතු වන රු. 950000.00 ක මුදල සභා අරමුදලින් දැරීම සඳහා මහ සභාවේ අනුමැතිය ඒකමතිකව ලබා දෙන ලදී.

**ලිපි අංක 04**
යොමු කරන්නා - විෂය භාරකරු, මස්කෙළිය ප්‍රාදේශීය සභාව.
විෂය - 2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා සහ එම කරුණ පුවත් දැන්වීමක් ලෙස පල කිරීම සඳහා සභා අනුමැතිය ඉල්ලමින් ඉදිරිපත් කරන ලද ලිපිය.

**තීරණ අංක 06**
2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා සහ එම කරුණ පුවත් දැන්වීමක් ලෙස පල කිරීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

**ලිපි අංක 05**
යොමු කරන්නා - විෂය භාරකරු, මස්කෙළිය ප්‍රාදේශීය සභාව.
විෂය - සභා අනුමැතිය ලබා ගැනීම සඳහා 2023 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම සභාවට ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 07**
2023 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්මට අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

**ලිපි අංක 06**
යොමු කරන්නා - තාක්ෂණ නිලධාරි, මස්කෙළිය ප්‍රාදේශීය සභාව.
විෂය - රිකාටන් කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ ඇති පොහොර හලන යන්ත්‍රයේ දැල (Net එක) ලබාගැනීම පිළිබඳ වූ ලිපිය.

**තීරණ අංක 08**
රිකාටන් කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ ඇති පොහොර හලන යන්ත්‍රයේ දැල (Net එක) ලබාගැනීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**ලිපි අංක 07**
යොමු කරන්නා - කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය.
විෂය - කාන්තාවන්ගේ සුභසාධනය පිළිබඳ පුහුණුව ලබාදීම සම්බන්ධවූ ලිපිය.

**ලිපි අංක 08**
යොමු කරන්නා - සසිකාන්තන්, අංක 01, ප්‍රධාන වීදිය, සාමිමලේ.
විෂය - සාමිමලේ පිහිටි මාළු වෙළඳසැල පිළිබඳ වූ පැමිණිලි ලිපිය.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක. කො)</u>**

ඉහත සඳහන් ලිපිය පිළිබඳව ගරු මන්ත්‍රී පී. ආනන්දරාජ් මැතිතුමා විසින් අදහස් ප්‍රකාශ කරන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**

සභාවේ මූල්‍යමය හිඟයක් පවතින බැවින් හිටපු පළාත් සභා සහ පලාත් පාලන අමාත්‍යතුමා වෙත කරන ලද ඉල්ලීමකට අනුව ලැබුණු මුදලිනුයි එම කඩය ඉදිකළේ. එම කඩය එම ස්ථානයේ ස්ථානගත කිරීමට යන අවස්ථාවේදී ඕල්ටන් වතු පරිපාලනය එකී ඉඩම් කොටස ඔවුන්ට අයත් බවට පවසමින් නඩුවක් පැවරුවා. ඒ සම්බන්ධ වූ පරීක්ෂණයට මා සමග ආදායම පරීක්ෂක සහ තාක්ෂණ නිලධාරී යන මහත්වරුන්ද පැමිණ සිටියා. පසුව ලංකා කම්කරු කොංග්‍රසයේ අධ්‍යක්ෂක යෝගදාස් මහතා සමඟ  මේ පිළිබඳව පවසා වතු අධිකාරී සමග සාකච්ඡා කර එම බිම් කොටස ලබා ගත්තා. එමෙන්ම කාණු පද්ධති සියල්ල සභාවට අයත් වෙනවා. කාණු පද්ධතියට ඉහළින් ගොඩනැගිලි ඉදිකිරීම ඒ අයගේ වරදක්. පිහිටන ලද කඩය ඉවත් කරන්න බැහැ. මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් මේ පිළිබඳ වාර්තාවක් ලබා දෙන්නේ නම් ඒ සම්බන්ධයෙන් විකල්ප ක්‍රියාමාර්ගයක් ලබාගත හැකියි. ඊට හේතුව මෙය අමාත්‍යාංශය විසින් ලබාදෙන ලද ප්‍රතිපාදනයක් වීමයි. පසුව විගණන පරීක්ෂණ සඳහා මුහුණ දීමට සිදුවන්නේ ද අපිටයි.

**<u>ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො)</u>**

මෙම කාරණාව සම්බන්ධයෙන් ගරු උප සභාපතිතුමා විසින් අදහස් ඉදිරිපත් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

ගරු මන්ත්‍රීතුමා විසින් තැපැල් කාර්යාලයට  යාබදව පිහිටි ගිනි කපොල්ල සම්බන්ධවද  මස්කෙළිය නගරයේ පිහිටි මාළු වෙළෙඳ සැල්වල අපවිත්‍ර ජලය බැහැර කිරීම පිළිබඳවද අදහස් ඉදිරිපත් කරන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**

මේ පිළිබඳව මමත් කිහිප වතාවක් පවසා තිබෙනවා.  මේ සඳහා ක්‍රියාමාර්ගයක් ගනිමු. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ ලිපිය ලැබුණු වහාම මේ පිළිබඳව තීරණයක් ලබා ගනිමු.

**<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>**

සාමිමලේ මාළු වෙළඳසැල සම්බන්ධ වූ ලිපිය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් අදහස් ඉදිරිපත් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

සාමිමලේ මාළු වෙළඳසැල සම්බන්ධ වූ ලිපියේ පිළිබඳව ගරු මැතිතුමා විසින් අදහස් ඉදිරිපත් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

රථ ගාල සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී තුමා විසින් අදහස් දක්වන ලදී.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**

නල්ලතන්නිය රථ ගාල සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී එස්. සුරේෂ්කුමාර් මැතිතුමා විසින් අදහස් ඉදිරිපත් කරන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
නල්ලතන්නිය රථ ගාල සම්බන්ධයෙන් සොයා බලන ලෙසට මම තාක්ෂණ නිලධාරි මහතාට පවසා තිබෙනවා. මමත් මේ පිළිබඳව අවධානය යොමු කරනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
සභාව සදහා අවශ්‍ය ඉඩම් ලබා ගැනීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී පී. රාජ්කුමාර් මැතිතුමා විසින් අදහස් ඉදිරිපත් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගවරවිල ප්‍රාදේශයෙ සිදු කරන ලද එලවළු වගාව දැනුම් දීමකින් තොරව වතු අධිකාරිය විසින් විනාශ කිරීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් අදහස් ඉදිරිපත් කරන ලදී.

## 04. මුදල් සහ අනෙකුත් කමිටු වාර්තා ඉදිරිපත් කිරීම.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
මීළඟට මුදල් සහ අනෙකුත් කමිටු වාර්තා සභාවට ඉදිරිපත් කරමු.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ආයුර්වේද රෝහල සදහා භාණ්ඩ කිහිපයක් මිලදී ගැනීම පිළිබඳව මුදල කමිටු වාර්තාවේ සඳහන් වෙනවා. ඒ සමගම  රෝහලට අවශ්‍ය බෙහෙත් ටිකත් මිලදී ගන්නා ලෙසට ඉල්ලා සිටිමි.

තවද, මස්කෙළිය නගරයේ සංවර්ධන කටයුතු සඳහා ඒ හා සම්බන්ධ වැඩසටහන් දියත් කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරීම පිළිබඳව ගරු මන්ත්‍රී තුමා විසින් අදහස් ඉදිරිපත් කරන ලදී.

ශ්‍රීපාදස්ථාන වන්දනා සමයේදී රාජකාරි ඉටුකරන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිළධාරී මහතා විශ්‍රාම ගැනීමට නියමිත බැවින් ඒ වෙනුවට වෙනත් අයෙකු පත්කිරීම සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට ලක් විය.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
ගරු මන්ත්‍රීතුමනි, මෑතකදී රුපියල් ලක්ෂයක් වටිනා බෙහෙත් ද්‍රව්‍ය මිලදී ගත්තා.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>**
මුදල් කමිටු වාර්තාව නිවැරදි බවට මම යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
එම යෝජනාව මා ස්ථිර කරමි.

## 2022.12.01 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව නිර්දේශයෙන් පසු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

### කාරණා අංක 01

මස්කෙළිය ප්‍රාදේශීය සභාවට ගලි ටැංකිය ලබා ගැනිම සඳහා අනුමත ණය මුදල මෙම මස තුලම නිදහස් කර ගැනිමට අදාල ඉදිරි කටයුතු සිදුකිරිම සම්බන්ධව කරුණු සාකච්ඡා කරන ලදී.

එහිදී, මස්කෙළිය ප්‍රාදේශීය සභාව වෙත ගලි ටැංකිය ලබා ගැනීම සඳහා නිර්දේශිත පිරිවිතරයන්ට අනුකූලව මිළ ගණන් කැඳවා, තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශයන්ට අනුව මහ සභාවේ ආවරණ අනුමැතියට යටත්ව අදාල මිළදී ගැනීම සිදු කිරිම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුව නිර්දේශ කරන ලදී.

**තීරණ අංක 09**
මස්කෙළිය ප්‍රාදේශීය සභාව වෙත ගලි ටැංකිය ලබා ගැනීම සඳහා නිර්දේශිත පිරිවිතරයන්ට අනුකූලව මිළ ගණන් කැඳවා, තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශයන්ට අනුව මහ සභාවේ ආවරණ අනුමැතියට යටත්ව අදාල මිළදී ගැනීම සිදු කිරිම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

## 2022.12.08 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව නිර්දේශයෙන් පසු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

### කාරණා අංක 01

නොවැම්බර් මස ආදායම් හා වියදම් තනි තනියෙන් පැහැදිලිව මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදි.

**තීරණ අංක 10**
නොවැම්බර් මස ආදායම් හා වියදම් වාර්තාව නිවැරදි බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් පිළි ගන්නා ලදි. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

### කාරණා අංක 02

ඇඳක් සහ බර මැනීමේ යන්ත්‍රයක් අවශ්‍යශ බවත් එම භාණ්ඩ ලබාදෙන ලෙසත් ඉල්ලා සිටිමින් ආයුර්වේද වෛද්‍යතුමිය මඟින් ඉදිරිපත් කරන ලද ලිපිය මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 11**
එම ඇඳ සහ බර මැනිමේ යන්ත්‍රය ලබාදීමට මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

### කාරණා අංක 03

ZB 0394 අංක දරණ කම්පැක්ටර් රථයේ ආසන පාවිච්චිය සඳහා නුසුදුසු තත්වයේ පවතින බවත් එහි ශබ්ද විකාශන යන්ත්‍රය ක්‍රියා විරිහිතව ඇති බවත් දන්වා එම රථයේ රියදුරු මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 12**
ZB 0394 අංක දරණ කම්පැක්ටර් රථයේ ආසන සහ ශබ්ද විකාශන යන්ත්‍රය සකස්කර දීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 04**

RF 7747 අංක දරණ ට්‍රැක්ටර් රථයේ Bold Joint ගෙවී ඇති බැවින් ඒවා අළුතින් සවිකර දෙන ලෙස ඉල්ලා එම රථයේ රියදුරු මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 13**

උක්ත කරුණ තාක්ෂණ කමිටුවට ඉදිරිපත් කර තාක්‍ෂණ කමිටුවේ අනුමැතිය ලබා ගැනිමෙන් පසු එම රථය සඳහා Bold Joint ලබාදීමට මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 05**

ශ්‍රී පාද වන්දනා සමයේ ප්‍රදර්ශනය කිරීම සඳහා යොදා ගනු ලබන බැතිමතුන්හට අවවාද කිරීමේ පුවරු සඳහා මුදල් අය කිරීම සම්බන්ධව මුදල් කමිටුවේදී කරුණු සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 14**

බැතිමතුන්හට අවවාද කිරීමේ පුවරු සහ ආගමික සම්බන්ධව ප්‍රදර්ශනය කර ඇති පුවරු සඳහා මුදල් අය නොකර අනෙකුත් සියළු ප්‍රදර්ශන පුවරු සඳහා මුදල් අය කිරීමට මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**05. යෝජනා**

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

මීළඟට ගරු මන්ත්‍රී ටී. වසන්තකුමාර් මැතිතුමාගේ විශේෂ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී ටී.වසන්තකුමාර් මැතිතුමා (ලං.ක.කො)**

පසුගිය කාලයේ හොරණ ප්ලාන්ටේෂන් සමාගම යටතේ පාලනය වන වතු සම්බන්ධයෙන් විවිධ ගැටළුවලට මුහුණ දී තිබෙනවා. මෙම වතුවල පිහිටි මුඩු ඉඩම්වල එම වතුවල පදිංචි තරුණයන් එළවළු වගා කර තිබුණා. විශේෂයෙන් ගවරවිල වතු අධිකාරිය බලහත්කාරයෙන් එම වගාවන් JCB යන්ත්‍ර යොදා ගනිමින් ඉවත්කිරීමට සූදානම් කළ අවස්ථාවේ ගරු මන්ත්‍රී වසන්තකුමාර් වන මා එයට බාධා කිරීමට ගිය අවස්ථාවේ වතු අධිකාරිවරයා මට විරුද්ධව පොලිසියට පැමිණිලි කලා. එපමණක් නොවෙයි, වත්තේ සේවය කරන කම්කරුවන්ට අනිවාර්යයෙන් කිලෝග්‍රෑම් 18 ක් දළු නෙළන ලෙසටද පැවසුවා. මෙලෙස බලපෑම් කරමින් මෙවැනි විවිධ ගැටළුවලට මුහුණ දීමට සිදු වුණා.

මෙම ගැටළු සඳහා විසඳුමක් ලබා ගැනීමට මෙය නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සහ ලංකා කම්කරු කොංග්‍රස් ප්‍රධාන ලේකම් ගරු ජීවන් තොන්ඩමන් මැතිතුමාගේ අවධානය සඳහා යොමු කළා. වහාම ක්‍රියාත්මක වෙමින් දින 06 ක් එම ස්ථානයට සම්බන්ධ වෙමින් එම ගැටළු කම්කරු උසාවිය දක්වා යොමු කළා. තවද එම වත්තේ කර්මාන්ත ශාලාවේ වැඩ කල නල්ලයියා සිවකුමාර් යන අය අනතුරකට ලක්වීම සම්බන්ධයෙන් ද විරෝධය පල කරමින් ඒ සඳහා ද අවශ්‍ය කටයුතු සිදු කර දුන්නා. එතුමාටද සභාවේ ගරු සභාපති තුමියටද ගරු මන්ත්‍රී සුරේෂ් කුමාර් මැතිතුමාටද අනෙකුත් ගරු මන්ත්‍රීවරුන්ටද මේ අවස්ථාවේදී මා ඉන්දීය සම්භවය ඇති ජනතාව වෙනුවෙන් ද, වතුකරයේ පොදු ජනතාව වෙනුවෙන් ද ස්තුතිය පුදකරමි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

මෙම ගැටළුවේදී මාහට හැකි උපරිම අයුරින් මාගේ සහයෝගය ලබා දුන්නා.

## 06. අනෙකුත් කරුණු, විශේෂ දැනුම්දීම් සහ ඉදිරි සභා රැස්වීම සඳහා දිනය දැනුම් දීම

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
මේ සමඟ අද දින සභා කටයුතු සාමකාමීව පවත්වාගෙන යාම සඳහා සහයෝගය ලබා දුන් ඔබ සැමට ස්තූතියි. මෙයින් සභා රැස්වීම් කටයුතු අවසන් කරමි.

සභාපති,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.

ලේකම්,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.